## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

### බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
### බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම - 2023

# <u>විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව</u>

## <u>ලියාපදිංචියට තෝරා ගැනීම සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්</u>

පහත සඳහන් විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් ඇතුළුව අ.පො.ස උසස් පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍ය තුනක් (C) සහිතව සමත්වීම.

- ගණකාධිකරණය
- ව්‍යාපාර අධ්‍යයනය
- ව්‍යාපාර සංඛ්‍යානය
- ආර්ථික විද්‍යාව
- ගණිතය
- සංයුක්ත ගණිතය
- උසස් ගණිතය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය මඟින් තෝරා ගැනීමේ පරීක්ෂණයක් පවත්වන්නේ නම් එම පරීක්ෂණය සමත්වීම සහ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

මෙම උපාධි පාඨමාලාවේ එක් අධ්‍යයන වර්ෂයකට අර්ධ වාර්ෂික දෙකක් ලෙස අධ්‍යයන කටයුතු (සම්මන්ත්‍රණ/විභාග) පවත්වනු ලැබේ. ඒ අනුව අධ්‍යයන වර්ෂ තුන පහත පරිදි අර්ධ වාර්ෂික 06කින් සමන්විතය.

| අධ්‍යයන වර්ෂය | අර්ධ වාර්ෂික |
|---|---|
| ප්‍රථම වසර | ප්‍රථම අර්ධ වාර්ෂිකය |
| | දෙවන අර්ධ වාර්ෂිකය |
| දෙවන වසර | ප්‍රථම අර්ධ වාර්ෂිකය |
| | දෙවන අර්ධ වාර්ෂිකය |
| තෙවන වසර | ප්‍රථම අර්ධ වාර්ෂිකය |
| | දෙවන අර්ධ වාර්ෂිකය |

## පාඨමාලාවේ ගාස්තු

විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ ගාස්තු පහත පරිදි වේ.

| ගාස්තුව | මුදල (රුපියල්) | ගෙවිය යුතු කාල සීමාව |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තුව | 15,000.00 | ලියාපදිංචි ගාස්තු හා පාඨමාලා ගාස්තු පළමු වාරිකය ලියාපදිංචි වන අවස්ථාවේදී ගෙවිය යුතුයි. |
| පාඨමාලා ගාස්තු පළමු වාරිකය | 60,000.00 | |
| පාඨමාලා ගාස්තු දෙවන වාරිකය | 60,000.00 | පළමු වසර පළමු අර්ධ වාර්ෂික පරීක්ෂණයට පෙර ගෙවිය යුතුයි. (විශ්වවිද්‍යාලය විසින් ලබා දෙන පාඨමාලා ගාස්තු ගෙවිය යුතු අවසන් දිනට පෙර) |
| පාඨමාලා ගාස්තු තෙවැනි වාරිකය | 50,000.00 | පළමු වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණයට පෙර ගෙවිය යුතුයි. (විශ්වවිද්‍යාලය විසින් ලබා දෙන පාඨමාලා ගාස්තු ගෙවිය යුතු අවසන් දිනට පෙර) |

පාඨමාලා ගාස්තු අයකරනුයේ සම්පූර්ණ උපාධි පාඨමාලාව සහ විභාග සඳහා වන අතර පළමු වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණයට පෙර ඉහත සියලුම ගාස්තු ගෙවීම අනිවාර්ය වේ. ගෙවීම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අවකාශය නොලැබේ.

## ලියාපදිංචිය සඳහා තෝරා ගැනීම

ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය තීරණය කරනු ලබන ක්‍රමවේදයකට අනුව සුදුසුකම් ඇති අයදුම්කරුවන් ලියාපදිංචි කරනු ලැබේ.

## උපාධි පාඨමාලාවේ මාධ්‍යය

විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය හැකිය. ඔබ විසින් විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් යොමුකරන අවස්ථාවේදී පාඨමාලා මාධ්‍ය තෝරා ගත යුතු වේ.

## විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි ශිෂ්‍ය අත්පොත සහ විස්තරාත්මක විෂය නිර්දේශය

2023 අධ්‍යයන වර්ෂය සඳහා විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි ශිෂ්‍ය අත්පොත සහ විස්තරාත්මක විෂය නිර්දේශය www.external.sjp.ac.lk යන වෙබ් අඩවියේ පළ කර ඇත.

## විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වීම

විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ වසර තුනෙහි අර්ධ වාර්ෂික 06 සඳහා සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය වන පරිදි විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය විසින් මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ දේශන පවත්වනු ලබයි. එම දේශනවලට සජීවී ලෙස සහභාගී වීම අත්‍යවශ්‍ය වන අතර, පසු භාවිතය සඳහා අදාල පටිගත කල දේශන විද්‍යුත් ඉගෙනුම් කළමනාකරණ පද්ධතියෙහි (LMS) අදාල විෂය යටතේ ප්‍රදර්ශනය කරනු ලැබේ.

## උපාධි පරීක්ෂණ සඳහා පෙනී සිටීම

සම්මන්ත්‍රණ අවසන් වූ පසු පරීක්ෂණ සඳහා **www.external.sjp.ac.lk වෙබ් අඩවිය ඔස්සේ පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ. **නියමිත පරිදි පාඨමාලා ගාස්තු සියලුම වාරික ගෙවා පරීක්ෂණයට අයදුම් කළ අයට පමණක්** විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

පාඨමාලා ගාස්තු වාරික ගෙවීමේ අයදුම්පත්, සම්මන්ත්‍රණ කාලසටහන්, විභාග කාලසටහන්, විභාග ප්‍රවේශ පත්‍ර සහ සියලුම විස්තර **www.external.sjp.ac.lk වෙබ් අඩවිය ඔස්සේ පමණක්** නිකුත් කෙරේ.

**** දිනපතා www.external.sjp.ac.lk වෙබ් අඩවිය පරිශීලනය කිරීම අනිවාර්ය වේ.**

**තැපැල් මඟින් ලිපි එවනු නොලැබේ.**

## ලියාපදිංචිය අවලංගු කිරීම

උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ පසු ලියාපදිංචිය අවලංගු කරන්නේ නම් ඔබ වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත සමඟ ඉල්ලීම් ලිපියක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචිය අවලංගු කිරීමේදී මුදල් නැවත ගෙවීමක් සිදු කරනු ලබන්නේ පහත සඳහන් හේතුවලට පමණි.

a) **ලියාපදිංචි වූ දින සිට සති දෙකක් ඇතුළත කරනු ලබන ඉල්ලීම්** සඳහා පමණක් ගෙවන ලද ලියාපදිංචි ගාස්තු හැර (ලියාපදිංචි ගාස්තු රු.15,000/- නැවත ගෙවනු නොලැබේ) පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන මුදල් ආපසු ගෙවනු ලැබේ. මෙම කාල සීමාවෙන් පසු පාඨමාලා ගාස්තු නැවත ගෙවන ලෙස කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

b) යම් අයකු බාහිර උපාධි පාඨමාලාවකට ලියාපදිංචි වී **ප්‍රථම වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය පැවැත්වීමට පෙර, රාජ්‍ය විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන්** ලියාපදිංචි වුවහොත් ලියාපදිංචි ගාස්තු හැර (ලියාපදිංචි ගාස්තු රු.15,000/- නැවත ගෙවනු නොලැබේ) පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන මුදල් ආපසු ගෙවනු ලැබේ.

## අයදුම්පත් යොමු කිරීමේදී සැළකිලිමත් විය යුතු කරුණු

1. අයදුම්පත් යොමු කළ හැක්කේ මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණි. ඒ අනුව external.sjp.ac.lk වෙබ් අඩවියට පිවිස නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත යොමු කළ (Submit) යුතුය. මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ අයදුම්කරන ලද උපාධි පාඨමාලාව ඉන් පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.

| |
|---|
| ** **ඔබගේ පහසුව සඳහා මේ සම්බන්ධයෙන් සකස් කරන ලද වීඩියෝවක් www.external.sjp.ac.lk වෙබ් අඩවියෙහි පල කර ඇත.** |

2. අයදුම්පත යොමු කිරීමේදී පහත සඳහන් ලේඛන ස්කෑන් කර (Scan) උඩුගත (Submit) කළ යුතුය.

   i. සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්.
   ii. අ.පො.ස උසස් පෙළ සහතිකයේ සහතික කරන ලද පිටපතක්.
   iii. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්.
   iv. බැංකුවට මුදල් ගෙවන ලද රිසිට්පතේ මුල් පිටපත (Customer Copy) හෝ VISA සහ Master (debit/credit) කාඩ්පත් මගින් ගෙවීම් කරන්නේ නම් ගෙවීම් කල බව තහවුරුකිරීමේ මුද්‍රිත සාක්ෂි සටහනක් (Online receipt)

3. ඉහත සඳහන් ලේඛනවල පිටපත් සමග සම්පූර්ණ කරන ලද අයදුම්පත (Hard copy) පහත සඳහන් ලිපිනයට 2023.10.31 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

   **(සැ.යු. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර තමා ඉල්ලුම් කරන උපාධි පාඨමාලාවේ නම සඳහන් කර එවිය යුතුය.)**

   **අයදුම්පත යොමු කළ යුතු ලිපිනය** ඃ නියෝජ්‍ය ලේඛකාධිකාරී
   බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
   ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
   තැ. පෙ. අංක 10
   ගංගොඩවිල
   නුගේගොඩ

4. ඔබ විසින් **විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට අදාළ ගිණුම් අංකයට 072010007127 පමණක් බැර වන පරිදි** දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් හෝ VISA සහ Master (debit/ credit) කාඩ්පත් මගින් රු. 3000/- මුදලක් (ආපසු නොගෙවන) ගෙවා ලබා ගත් රිසිට්පත අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. **ඔබ ඉල්ලුම් කිරීමට අපේක්ෂිත බාහිර උපාධි පාඨමාලාවේ ගිණුම් අංකයට පමණක් මුදල් ගෙවීම අනිවාර්ය වේ (බැංකු රිසිට්පතේ ඡායා පිටපතක් සහ ඔබ** VISA සහ Master (debit/ credit) **කාඩ්පත් මගින් ගෙවීම් කරන්නේ නම්** ගෙවීම් කල බව තහවුරු කිරීමේ මුද්‍රිත සාක්ෂි සටහනක් (Online receipt) ළග තබා ගත යුතුවේ)

5. අධ්‍යාපන සුදුසුකම් යටතේ අ.පො.ස (උ/පෙළ) සහතිකය පිළිගනු ලබන්නේ පහත සඳහන් එක් ක්‍රමයක් යටතේ ඉදිරිපත් කළහොත් පමණි.

   - පාසලේ ලිපි ශීර්ෂය යටතේ **විදුහල්පතිගේ අත්සනින් නිකුත් කරනු ලබන** සහතිකය
   - පාසල් අයදුම්කරුවන් -අන්තර්ජාලය මගින් ලබාගත් ප්‍රතිඵල ලේඛනයේ **පාසලේ විදුහල්පති සහතික කරන ලද** පිටපත හෝ විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද මුල් පිටපතේ සහතික කරන ලද පිටපත
   - පෞද්ගලික අයදුම්කරුවන් - අන්තර්ජාලය මගින් නොව විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද **මුල් සහතිකයේ** සහතික කරන ලද පිටපත

6. අයදුම්පත සමග අධ්‍යාපන සහතිකයේ සහ අනෙකුත් ලේඛනවල සහතික කළ පිටපත් පමණක් එවිය යුතුය. (මුල් පිටපත් එවීම අවශ්‍ය නොවේ)

7. අන්තර්ජාලය මගින් ලබාගත් ප්‍රතිඵල ලේඛනය හැර අනෙකුත් ලේඛනවල පිටපත් සහතික කළ යුත්තේ **රජයේ හෝ අනුමත කළ පාසලක ප්‍රධානියෙකු/ විශ්වවිද්‍යාල ආචාර්යවරයකු/ රජයේ දෙපාර්තුමේන්තුවක හෝ සංස්ථාපිත ආයතනයක විධායක නිලධාරියකු/ නීතිඥවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ ග්‍රාම නිලධාරියකු** විසිනි. එකී පිටපත්වල සහතික කරන නිලධාරියාගේ අත්සන සහ නිලමුද්‍රාව තිබීම අනිවාර්ය වේ.

---

- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- එක් අයදුම්කරුවකුට උපාධි පාඨමාලා කිහිපයකට අයදුම් කළ හැකිය. ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් යොමු කළ යුතු අතර අදාළ ගෙවීම් ද වෙන් වෙන් වශයෙන් අදාළ ගිණුම් අංකවලට ගෙවිය යුතුය. අදාළ නිර්ණායක සම්පූර්ණ කිරීමෙන් පසු එක් අයදුම්කරුවකුට ලියාපදිංචි විය හැක්කේ එක් උපාධි පාඨමාලාවක් සඳහා පමණි.

- එක් එක් උපාධි පාඨමාලාවන්ට නියමිත ගිණුම් අංකයට ගෙවීම් සිදු නොකර එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

***** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට අනුබද්ධ කිසිදු නියෝජිත ආයතනයක් නොමැත. එබැවින් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස උක්ත සඳහන් ක්‍රමවේදය පමණක් අනුගමනය කළ යුතුය. වෙනත් නියෝජිතායතන හරහා ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳව විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ.***



නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2023-09-24